JMC vLearning
"your virtual learning partner"

# නියාමන ප්‍රශ්න පත්‍රය
# (Pilot Paper)

## වරලත් ගණකාධිකරණය - ව්‍යාපාරික අදියර II
BL6 - කළමනාකරණ ගිණුම්කරණය (MA)

## Pack 05


උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

**Business Level II**

**Management Accounting (BL 6)**

**Pilot Paper**

**විභාග අපේක්ෂකයන්ට උපදෙස්**

1) කාලය පැය 2 කි

2) මුළු ලකුණු 100 කි

3) ප්‍රශ්න 50 කි. සියළුම ප්‍රශ්න අනිවාර්ය වේ.

4) සියළුම පිළිතුරු නියමිත මාධ්‍යයෙන් එක් භාෂාවකින් විය යුතු අතර එය අයදුම් කළ මාධ්‍යය විය යුතුය.

1. කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස නිවැරදිව විස්තර කෙරෙනුයේ පහත දැක්වෙන කවර ප්‍රකාශයෙන්ද?

(අ) මූල්‍ය ගිණුම්කරණය බාහිර පරිශීලකයින්ට තොරතුරු සපයන අතර, කළමනාකරණ ගිණුම්කරණය අභ්‍යන්තර පරිශීලකයින්ට තොරතුරු සපයයි.

(ආ) මූල්‍ය ගිණුම්කරණය අභ්‍යන්තර පරිශීලකයින්ට තොරතුරු සපයන අතර, කළමනාකරණ ගිණුම්කරණය බාහිර පරිශීලකයින්ට තොරතුරු සපයයි.

**(ඇ) මූල්‍ය ගිණුම්කරණය බාහිර සහ අභ්‍යන්තර පරිශීලකයින්ට තොරතුරු සපයන අතර, කළමනාකරණ ගිණුම්කරණය අභ්‍යන්තර පරිශීලකයින්ට පමණක් තොරතුරු සපයයි.**

(ඈ) මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය යන දෙකම අභ්‍යන්තර පරිශීලකයින්ට තොරතුරු සපයයි.

2. අදාළ පරාසය තුළ ..........පිරිවැය වෙනස්වීම් මුළු එකතුව ධාවකයෙහි වෙනස්වීම් වලට සෘජුවම අනුපාතික වෙයි. අදාළ පරාසය තුළ ...........පිරිවැය වෙනස්වීම්වල මුළු එකතුව ධාවකයෙහි වෙනස්වීම් වලට සෘජුවම අනුපාතික නොවෙයි.

(අ) ස්ථාවර, විචල්‍ය

**(ආ) විචල්‍ය, ස්ථාවර**

(ඇ) පියවර (Step), මිශ්‍ර

(ඈ) මිශ්‍ර, පියවර (Step)

පහත දැක්වෙන තොරතුරු උපයෝගි කරගෙන 3 වැනි සහ 4 වැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිෂ්පාදකයෙකුගේ නිමැවුම් මට්ටම් සහ අදාළ මුළු පිරිවැය එකතුවෙහි අගය පහත සඳහන් අයුරිනි.

| **නිමැවුම් මට්ටම්** | **පිරිවැය එකතුව (රු)** |
|---|---|
| 3000 | 27,000 |
| 3400 | 29,000 |
| 3700 | 30,500 |
| 4500 | 34,500 |
| 5200 | 44,000 |
| 5500 | 45,500 |

ඒකක 4500 ඉක්මවූ පසුව වැඩිවන "පියවර ස්ථාවර පිරිවැයක් "(Step fixed cost) පිරිවැය එකතුවට ඇතුළත්ය.

3. ඒකකයකට විචල්‍ය පිරිවැය කොපමණද?

   **(අ) රු. 5.00**

   (ආ) රු. 7.00

   (ඇ) රු. 4.00

   (ඈ) රු. 8.00

4. ඒකක 4500 ට පසු ස්ථාවර පිරිවැයෙහි වෙනස්වීම් කොපමණද?

   (අ) රු. 12,000

   **(ආ) රු. 6,000**

   (ඇ) රු. 18,000

   (ඈ) රු. 8,000

5. අදාළ මෙහෙයුම් පරාසය තුළ විචල්‍ය පිරිවැයක් වනුයේ පහත දැක්වෙන කවර පිරිවැයද?

   (අ) ඉලෙක්ට්‍රොනික නිෂ්පාදකයෙකුගේ කර්මාන්තශාලා ගොඩනැගිල්ල සඳහා කුලී වියදම්

   (ආ) ඉලෙක්ට්‍රොනික නිෂ්පාදකයෙකුගේ කර්මාන්තශාලා යන්ත්‍ර සූත්‍ර සඳහා වන කල්බදු පිරිවැය

   **(ඇ) ගුවන්යානා සමාගමක් සඳහා ගුවන්යානා වෙනුවෙන් වූ ඉන්ධන**

   (ඈ) ගුවන්යානා සමාගම සඳහා ගුවන්යානා ක්ෂයවීම් වියදම

නිෂ්පාදන පිරියතක සම්පූර්ණයෙන් අවසන් කරන ලද කාර්යයක් (job) සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු අදාල වෙයි.

මෙම තොරතුරු උපයෝගි කරගනිමින් 6 වැනි සහ 7 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඒකක 10ක කාර්යයක් (Job) සඳහා 20.50 පිරිවැයට අමුද්‍රව්‍ය කි. ග්‍රෑම් 25 ක්ද, ශ්‍රම පැයකට රු. 160/- පිරිවැයට, කම්කරු පැය 10 ක් සහ අනෙකුත් සෘජු වෙනත් වියදම් සඳහා රු. 450/- ක් අවශ්‍ය කෙරේ. සමාගම ක්‍රියාත්මක වනුයේ කුළී ගොඩනැගිල්ලක බැවින් මාසික කුළිය රු. 20,000 කි. මාසික අය වැය ගත (Budgeted) නිෂ්පාදනය ඒකක 1000 කි.

6. කාර්යයෙහි (Job) ප්‍රාථමික පිරිවැය (Prime cost) කොපමණද?

**(අ) රු. 2562.50**

(ආ) රු. 2652.50

(ඇ) රු. 2762.50

(ඈ) රු. 2752.50

7. කාර්යය (Job) අවසන් කිරීම සඳහා වන මුළු පිරිවැය කොපමණද?

(අ) රු. 2562.50

(ආ) රු. 2652.50

**(ඇ) රු. 2762.50**

(ඈ) රු. 2952.50

8. ඉදිරි මාසයෙහිදී ඒකක 5000 ක් විකිණීමට සජ්රෝ පුද්ගලික සමාගම ඇස්තමේන්තු (Budgeted) කළේය. ඒකකයක සම්මත විකුණුම් මිල සහ පිරිවැය විස්තර පහත සඳහන් පරිදිය.

| | |
|---|---|
| විකුණුම් මිළ | රු. 56.00 |
| විචල්‍ය පිරිවැය | රු. 24.00 |
| පොදු කාර්යය පිරිවැය (අවශෝෂණය) | රු. 12.00 |

ඉහත සඳහන් මාසයෙහි සමාගමට විකිණිය හැකි වූයේ ඒකක 4800ක් පමණක් වී නම්, විකුණුම් පරිමාවේ දායකත්ව විචල්‍යය කොපමණද?

(අ) රු. 6,400 වාසිදායක

(ආ) රු. 4,000 වාසිදායක

**(ඇ) රු. 6,400 අවාසිදායක**

(ඈ) රු. 4,000 අවාසිදායක

9. ප්‍රතිපෝෂනය (Feed back) සහ ඉදිරි පෝෂනය (Feed Forward) පාලනයන් අතර වෙනස නිවැරදිව විස්තර කෙරෙනුයේ පහත දැක්වෙන කුමන පිළිතුරෙන්ද?

(අ) ඉදිරි පෝෂන පාලකය, ප්‍රති ක්‍රියාශීලි මිනුමක් (reactive measure) වන අතර, ඉදිරි පෝෂන පාලනය ක්‍රියාකාරී මිනුමක් වෙයි.

**(ආ) ප්‍රතිපෝෂණ පාලනය ප්‍රති ක්‍රියාශීලි මිනුමක් වන අතර, ඉදිරි පෝෂන පාලනය ක්‍රියාකාරී මිනුමක් වෙයි.**

(ඇ) ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂන පාලන දෙකම ප්‍රති ක්‍රියාශීලි මිනුම් ලෙස ක්‍රියා කරයි.

(ඈ) ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂන පාලන දෙකට ක්‍රියාකාරී මිනුම් ලෙස ක්‍රියා කරයි.

10. නිමෙක්ස් සමාගම තොග කළමනාකරණයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) මාදිලිය භාවිතා කරයි. අමුද්‍රව්‍ය සඳහා වාර්ෂික ඉල්ලුම් කි.ග්‍රෑම් 95,000 කි. ඉල්ලුම් වර්ෂය පුරා ඒකාකාරීව ව්‍යාප්ත වී තිබෙයි. ඇනවුම් පිරිවැය ඇනවුමකට රු. 12 ක් වන අතර, තොග ඒකකයක රඳවා ගැනීමේ පිරිවැය වර්ෂයකට රු. 3.00 කි.

සමාගම වර්ෂයකට ඇනවුම් කීයක් කළ යුතුද?

(අ) ඇනවුම් 106

**(ආ) ඇනවුම් 109**

(ඇ) ඇනවුම් 872

(ඈ) ඇනවුම් 871

11. ආර්ථික ඇනවුම් ප්‍රමාණය යනු පහත දැක්වෙන කුමන ප්‍රතිඵලය ලබා දෙන ඇනවුම් ප්‍රමාණයද?

(අ) තොග ඇනවුම් කිරීමෙහි අවම පිරිවැය

(ආ) සැපයුම්කරුවන්ගේ ඉහළම වට්ටමක් ලැබීම

**(ඇ) තොග ඇනවුම් කිරීමේ සහ රඳවා ගැනීමේ (Holding)අවම ඒකාබද්ධ මුළු පිරිවැය**

(ඈ) තොග රඳවා ගැනීමේ (holding) අවම පිරිවැය

12. ශුද්ධ වර්තමාන අගය (N P V) සහ අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR) අතර වෙනස විස්තර නොකරන්නේ පහත දැක්වෙන කුමන ප්‍රකාශයෙන්ද?

(අ) NPV මගින් ව්‍යාපෘතියක් තුළින් ලැබෙන ප්‍රතිලාභය රුපියල් වලින් ලබෙන අතර, IRR මගින් අපේක්ෂිත ප්‍රතිලාභය ප්‍රතිශතකයක් ලෙස ලැබේ.

**(ආ) NPV සහ IRR ධන අගයක් ගන්නා විට ව්‍යාපෘතියක් පිළිගනු ලබයි.**

(ඇ) NPV මගින් ව්‍යාපෘතියේ අතිරික්තයන් කෙරෙහි අවධානය යොමු කරන අතර, IRR මගින් අවධානය යොමු කරන්නේ ව්‍යාපෘතියේ සමායතන අවස්ථාවේ (Break–Even) මුදල් ප්‍රවාහ කෙරෙහිය.

(ඈ) මුදල් ගලාඒම් ප්‍රාග්ධන පිරිවැය මත ප්‍රති ආයෝජනය කරනු ලැබේ යයි NPV මගින් උපකල්පනය කරන අතර, මුදල් ගලා ඒම් IRR අනුපාතයට ප්‍රති ආයෝජනය කරන බව IRR උපකල්පනය කරයි.

13. කර්මාන්තශාලා ගොඩනැගිල්ලෙහි රු. 100,000 ක් වන කුලී පිරිවැය දෙපාර්තමේන්තු තුනකට බෙදා හරිනු (allocate) ලැබේ. මෙම වියදම බෙදාහැරීම වර්ග අඩි 40,000 ක සමස්ත ක්ෂේත්‍රය පදනම් කරගෙන සිදු කෙරෙයි. කර්මාන්තශාලා ගොඩනැගිල්ල තුළ ඇති දෙපාර්තමේන්තු තුනට අදාළ තොරතුරු පහත දැක්වෙයි.

| **දෙපාර්තමේන්තුව** | **වර්ග අඩි** |
|---|---|
| A දෙපාර්තමේන්තුව | 15,000 |
| B දෙපාර්තමේන්තුව | 5,000 |
| C දෙපාර්තමේන්තුව | 20,000 |

දෙපාර්තමේන්තු තුනට බෙදා හරිනු ලබන (allocate) කුලී වියදම කොපමණද?

| | A දෙපාර්තමේන්තුව | B දෙපාර්තමේන්තුව | C දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| (අ) | රු. 15,000 | රු. 5,000 | රු. 30,000 |
| **(ආ)** | **රු. 37,500** | **රු. 12,500** | **රු. 50,000** |
| (ඇ) | රු. 37,500 | රු. 10,000 | රු. 50,000 |

(ඈ) මෙයින් එකක්වත් නොවේ.

14. වර්ෂයක ජනවාරි සිට මැයි දක්වා මාසික විකුණුම් (මිලියන වලින්) පහත දක්වා ඇත.

| මාසය | විකුණුම් (රුපියල් මිලියන වලින්) |
|---|---|
| ජනවාරි | 23 |
| පෙබරවාරි | 32 |
| මාර්තු | 40 |
| අප්‍රේල් | 23 |

| | |
|---|---|
| මැයි | 36 |

ඉහත විකුණුම් වල මාධ්‍ය (mean) මධ්‍යන (median) සහ මාත (mode) අගයන් නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කුමන පිළිතුරෙන්ද?

| | | | |
|---|---|---|---|
| (අ) | මිලියන 30.8 | මිලියන 40 | මිලියන 23 |
| **(ආ)** | **මිලියන 30.8** | **මිලියන 32** | **මිලියන 23** |
| (ඇ) | මිලියන 23 | මිලියන 32 | මිලියන 31 |
| (ඈ) | මිලියන 23 | මිලියන 40 | මිලියන 23 |

පහත සඳහන් තොරතුරු උපයෝගි කරගනිමින් 15 වැනි සහ 16 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ආර්ථික තත්ත්වයන් තුනක් යටතේ ව්‍යාපෘති දෙකක පුරෝකථනය කළ දායකත්වයන් (contributions) පහත දක්වා ඇත.

| **ආර්ථික තත්වය** | **A ව්‍යාපෘතිය** | **B ව්‍යාපෘතිය** |
|---|---|---|
| ශුභවාදී | 45,000 | 53,000 |
| බොහෝ දුරට විය හැකි | 40,000 | 38,000 |
| අශුභවාදී | 25,000 | 15,000 |

ඉහත ආර්ථික තත්වයක් ඇතිවීමේ සම්භාව්‍යතාවය ශුභවාදී සඳහා 0.3 න් ද බොහෝ දුරට සිදුවිය හැකි සඳහා 0.5 ක් ද අශුභවාදී සඳහා 0.2 ක් ද වෙයි

15. A සහ B ව්‍යාපෘතිවල අපේක්ෂිත මුළු දායකත්වය (contribution) කවරේද?
    (අ) රු. 38,500 සහ රු. 32,300
    (ආ) රු. 33,500 සහ රු. 37,900
    **(ඇ) රු. 38,500 සහ රු. 37,900**
    (ඈ) රු. 37,900 සිට රු. 36,200

16. ස්ථාවර පොදු කාර්ය පිරිවැය රු. 5,000/- ක් නම් අවදානම භාරගන්නා ආයෝජකයෙකු තෝරා ගත යුත්තේ කිනම් ව්‍යාපෘතියද? ඒ ඇයි?

    (අ) A අපේක්ෂිත ඉහළම මුළු වටිනාකම

    (ආ) **A අශුභවාදී තත්ත්වයේ ඇති ඉහළම පුරෝකථනය කළ ලාභය**

    (ඇ) B අපේක්ෂිත ඉහළම මුළු වටිනාකම

(ඈ)	B ශුභවාදී තත්ත්වයේ ඇති ඉහළම පුරෝකථනය කළ ලාභය

පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගැනිමින් 17 වැනි සහ 18 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සමාගමක් විසින් අනාගත වෙළෙඳ තත්ත්වයන් පුරෝකථනය කර “ඉහළ ඉල්ලුම” සහ “පහළ ඉල්ලුම” වශයෙන් අවස්ථා දෙකක් වර්ධනය කරනු ලැබ (developed) ඇත. එමෙන්ම ඒකක 30 ක් හෝ ඒකක 70 ක් නිපදවීමට සමාගමට හැකියාව ඇති අතර, ඒ මත පහත දැක්වෙන පරිදි ලාභ විචලනය වනු ඇත.

| | එක් එක් විකල්ප ක්‍රම යටතේ ලාභ | |
|---|---|---|
| විකල්ප ධාරිතාවයන් | ඉහළ ඉල්ලුම (60% අවස්ථාව) | පහළ ඉල්ලුම (40% අවස්ථාව) |
| ඒකක 30 ක් නිෂ්පාදනය කිරීම | 5,000 | 3,000 |
| ඒකක 70 ක් නිෂ්පාදනය කිරීම | 12,000 | 7,000 |

නිෂ්පාදනය කරන ප්‍රමාණය තීරණය කිරීමේදී ඔවුන්ට සහය පිණිස සමාගම තීරණ වෘක්ෂයක් (Decision Tree) භාවිතා කළේය.

17. නිෂ්පාදනය කලයුතු ඒකක ප්‍රමාණය සහ අපේක්ෂිත ලාභය කොපමණද?

(අ)	ඒකක 30, රු. 4,200

**(ආ)	ඒකක 70, රු. 4,400**

(ඇ)	ඒකක 30, රු. 3,000

(ඈ)	ඒකක 70, රු. 7,200

18.	අවදානම් ප්‍රතිපක්ෂ (Risk Averse) තීරණ ගන්නෙකු ඔහුගේ/ඇගේ තීරණය වෙනස් කිරීමට උනන්දු කරවනු ඇත්තේ කුමන අපේක්ෂිත ලාභ/අලාභ ප්‍රමාණයද?

(අ)	(රු. 7,000)

(ආ)	රු. 4,200

**(ඇ)	(රු. 2,800)**

(ඈ)	රු. 1,200

පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගනිමින් 19,20,21,22 සහ 23 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කම්ස් සහ සමාගම ඔවුන්ගේ නිපැයුම් සැකසීම සහ නිමකිරීම වශයෙන් ක්‍රියවලි දෙකකින් නිෂ්පාදනය කරයි. අගෝස්තු මාසය මුලදී රු. 8,300 ක් මිළ කල අරම්භක නොනිමි වැඩ (WIP) ඒකක 200 ක් සැකසීම ක්‍රියාවලියෙහි තිබුණේය. එහි මිළ වැටීම් (breakdown) පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| ද්‍රව්‍ය | - | Material (100% අවසන්) රු. 4,200 |
| ශ්‍රමය | - | Labour (60% අවසන්) රු. 1,000 |
| පොදු කාර්යය | - | Overheads (40% අවසන්) රු. 3,100 |

අගෝස්තු මාසය තුළ ද්‍රව්‍ය (Material) ඒකක 1,000 ක් සවිකිරීමේ ක්‍රියාවලියට එකතු කරනු ලැබීය. යන්ත්‍රවල සීමාකාරී බව හේතුවෙන් සවිකිරීමේ ක්‍රියාවලියට යොදවන ලද ද්‍රව්‍ය වලින් 10% ක අලාභයක් සමග ඒකකයකට රු. 11.00 ක සුන්බුන් වටිනාකමක් සමග වඩාත් අලාභයක් සිදුවන බව අපේක්ෂා කරන ලද්දේය.

අගෝස්තු මාසය අවසානය වන විට සවිකිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූ ඒකක 940 ක් ඊලග ක්‍රියාවලියකට මාරු කරනු ලැබීය. පහත දැක්වෙන ප්‍රමාණයන්ට සම්පූර්ණ වූ ඒකක 100 ක් අවසාන WIP තොගයට ඉතිරි වී තිබුණේය.

| | | |
|---|---|---|
| ද්‍රව්‍ය | - | Material (100% අවසන්) |
| ශ්‍රමය | - | Labour (60% අවසන්) |
| පොදු කාර්යය | - | Overheads (40% අවසන්) |

අගෝස්තු මාසයෙහි දරන ලද පිරිවැය පහත දැක්වෙන පරිදිය.

| | | | |
|---|---|---|---|
| ද්‍රව්‍ය | - | Material | රු. 22,200 |
| ශ්‍රමය | - | Labour | රු. 5,300 |
| පොදු කාර්යය | - | Overheads | රු. 10,800 |

19. සවිකිරීමේ ක්‍රියාවලියෙහි (එක් ඒකකයක) අසාමාන්‍ය අලාභය / ප්‍රතිලාභය කොපමණද?
    (අ) ඒකක 60 ක අසාමාන්‍ය ප්‍රතිලාභය
    (ආ) ඒකක 100 ක අසාමාන්‍ය අලාභය
    **(ඇ) ඒකක 60 ක අසාමාන්‍ය අලාභය**
    (ඈ) ඒකක 100 ක අසාමාන්‍ය ප්‍රතිලාභය

20. කාලසීමාව තුළ (අගෝස්තු) සැකිරීමේ ක්‍රියාවලියට දරන ලද මුළු පිරිවැය එකතුව කොපමණද?

(අ) රු. 46,800

**(ආ) රු. 38,300**

(ඇ) රු. 33,800

(ඈ) රු. 48,600

21. බරතැබූ සාමාන්‍ය ක්‍රමය යටතේ සැකිරීමේ ක්‍රියාවලියෙහි ද්‍රව්‍ය ඒකකයට ද්‍රව්‍ය පිරිවැය කොපමණද?

(අ) රු. 25.00

(ඇ) රු. 13.37

**(ඇ) රු. 23.00**

(ඈ) රු. 5.94

22. සැකිරීමේ ක්‍රියාවලියෙහි අසාමාන්‍ය අලාභය /ප්‍රතිලාභය පිරිවැය කොපමණද?

**(අ) අසාමාන්‍ය අලාභය රු. 2,539**

(ආ) අසාමාන්‍ය ප්‍රතිලාභය රු. 2,593

(ඇ) අසාමාන්‍ය අලාභය රු. 3,952

(ඈ) අසාමාන්‍ය ප්‍රතිලාභය රු. 3,529

23. සැකිරීමේ ක්‍රියාවලියෙන් ඊළඟ ක්‍රියාවලියට මාරු කරන ලද ඒකක වල පිරිවැය කොපමණද?

(අ) රු. 37,971

(ආ) රු. 32,771

**(ඇ) රු. 39,771**

(ඈ) රු. 27,971

පහත දැක්වෙන තොරතුරු උපයෝගි කරගනිමින් 24 වැනි සහ 25 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සමාගමක් සතියක් තුළ "D" නිෂ්පාදනය ඒකක 1,000 ක් නිෂ්පාදනය කළේය. "D" ඒකකයක් නිෂ්පාදනය කිරීම පිණිස පහත දැක්වෙන පිරිවැය අදාලය.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | - කි. ග්‍රෑමයට රු. 12.00 |
| සෘජු ශ්‍රමය | - ශ්‍රම පැයකට රු. 50.00 |
| සෘජු වෙනත් වියදම් | - ශ්‍රම පැයකට රු. 32.00 |

සතියකට රු. 240,000 වන පොදු කාර්ය පිරිවැය යන්ත්‍ර පැය ගණන් මත නිෂ්පාදන වලට අවශෝෂණය කරනු ලබයි. යන්ත්‍ර පැය 10 ක් ද්‍රව්‍ය කි. ග්‍රෑම් 3 ක් සහ ශ්‍රම පැය 2 ක් "D" නිෂ්පාදිත ඒකකයක් සඳහා භාවිතා වෙයි. සතිය අවසානයේ ඒකක 100 ක් තොගයෙහි ඉතිරි වී තිබුණේය.

24. සමාගම ආන්තික පිරිවැය භාවිතා කළේ නම් අවසාන තොගයෙහි වටිනාකම කොපමණද?

(අ) රු. 22,400

**(ආ) රු. 20,000**

(ඇ) රු. 6,200

(ඈ) රු. 9,400

25. සමාගම අන්තර්ග්‍රහණ පිරිවැය/අවශෝෂණ පිරිවැය (absorption costing) භාවිතා කළේ නම් අවසාන තොගයෙහි වටිනාකම කොපමණද?

(අ) රු. 20,000

(ආ) රු. 44,000

**(ඇ) රු. 22,400**

(ඈ) රු. 24,000

26. පිරිවැය ඒකක සඳහා විචල්‍ය පිරිවැය අයකරන ගිණුම්කරන පද්ධතිය සහ කාල පරිච්ඡේදයෙහි ස්ථාවර පිරිවැය සමස්ථ සමාහාර දායකත්වයට එරෙහිව සම්පූර්ණයෙන් ලියා හරින ගිණුම්කරන පද්ධතිය හඳුන්වනු ලබන්නේ මෙසේය.

(අ) අන්තර්ග්‍රහණ පිරිවැයකරණය

**(ආ) ආන්තික පිරිවැයකරණය**

(ඇ) කාර්ය පිරිවැයකරණය

(ඈ) සම්මත පිරිවැයකරණය

27. නිෂ්පාදන මාසයක් තුළ තොග මට්ටමේ ඉහළ යන්නේ නම්, පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් කවර ප්‍රකාශනය නිවැරදි වන්නේද?

(අ) අන්තර්ග්‍රහණ/අවශෝෂණ පිරිවැයකරණය මගින් ආන්තික පිරිවැයකරණයට වඩා අඩු ලාභයක් ලබාදෙයි.

(ආ) අන්තර්ග්‍රහණ පිරිවැයකරණය සහ ආන්තික පිරිවැයකරණය එකම ලාභය ලබාදෙයි.

(ඇ) ආවර්තක (periodic) ලාභයට තොරාගත් පිරිවැය ක්‍රමයෙහි බලපෑමක් නැත.

**(ඈ) අවශෝෂන/අන්තර්ග්‍රහණ පිරිවැයකරණය මගින් ආන්තික පිරිවැයකරණයට වඩා ඉහළ ලාභයක් ලබාදෙයි.**

28. නිෂ්පාදන අංශයක් මාසයකදී “X” නිෂ්පාදිතය ඒකක 100 ක් නිෂ්පාදනය කළේය. “X” හි සෑම ඒකකයක්ම ද්‍රව්‍ය කි.ග්‍රෑම් 14 ක් සහ ශ්‍රම පැය 20 ක් පරිභෝජනය කළේය. ද්‍රව්‍ය පිරිවැය කි.ග්‍රෑමයට රු. 230 ක් වන අතර, ශ්‍රම පිරිවැය ශ්‍රම පැයකට රු. 300කි. නිෂ්පාදන අංශයෙහි එම මාසයේ මුළු ආදායම රු. 1,200,000 කි. “X” හි ඒකකයකට ප්‍රතිදාන දායකත්වය (throughput contribution) කොපමණද?

**(අ) රු. 8,780**

(ආ) රු. 2,780

(ඇ) රු. 8,870

(ඈ) රු. 2,870

29. තීරණයකට අදාළ පිරිවැය හඳුනාගැනීමට මඟ පෙන්වීමක් නොවන සංකල්පයක් වනුයේ පහත දැක්වෙන ඒවා අතුරින් කවරක්ද?

(අ) අදාළ පිරිවැය යනු අනාගත පිරිවැයයි

**(ආ) අදාළ පිරිවැය යනු නොවැළැක්විය හැකි පිරිවැයයි**

(ඇ) අදාළ පිරිවැය යනු මුදල් ප්‍රවාහයයි

(ඈ) අදාළ පිරිවැය යනු වර්ධක (incremental) පිරිවැයයි

පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගනිමින් 30 වැනි සහ 31 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සමාගමක් සාමාන්‍යයෙන් මසකට ඒකක 1,000,000 ක් නිෂ්පාදනය කරයි. මෙම නිෂ්පාදන මට්ටමෙහිදී ඒකකයකට වන සම්මත පිරිවැය (standard costs) පහත දැක්වෙන පරිදිය.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය භාවිතය | රු. 14.00 |
| සෘජු ශ්‍රමය | රු. 6.00 |
| විචල්‍ය වක්‍ර නිෂ්පාදනය | රු. 1.00 |
| (Set up) සැකසුම් පිරිවැය | රු. 3.00 |

සැකසුම් පිරිවැය (Set up costs) එක් සැකසුමට රු. 6,000 කි. සමාගමට ඒකකයට රු. 22/- බැගින් ඒකක 100,000 ක් සඳහා විශේෂ ඇනවුමක් සමාගමට ලැබී ඇත. අතිරික්ත ධාරිතාවක් සමාගම සතුවේ. විශේෂ ඇනවුම සඳහා සැකසුම් 5 ක් අවශ්‍ය වන්නේ යැයි සමාගම ඇස්තමේන්තු කරයි.

30. විශේෂ ඇනවුමෙහි පිරිවැය කොපමණද?

(අ) රු. 2,100,000

**(ආ) රු. 2,130,000**

(ඇ) රු. 2,400,000

(ඈ) රු. 2,430,000

31. විශේෂ ඇනවුමෙහි ලාභය කොපමණද?

(අ) රු. 80,000

(ආ) රු. 170,000

**(ඇ) රු. 70,000**

(ඈ) රු. 200,000

32. විශේෂ ඇනවුම් තීරණ වලට සාමාන්‍යයෙන් වැදගත් නොවන්නේ පහත දැක්වෙන දෑ වලින් කවරක්ද?

(අ) විධිමත්/නිත්‍ය ව්‍යාපාරය මත විශේෂ ඇනවුමේ බලපෑම

**(ආ) ව්‍යාපාරයේ ස්ථාවර පිරිවැයෙහි මුළු එකතුව**

(ඇ) නිෂ්ක්‍රීය (ilde) ධාරිතාවයක් ඇත්තේද යන්න

(ඈ) විශේෂ ඇනවුම නිසා ඒකකට විචල්‍ය පිරිවැයෙහි වැඩිවීම.

33. නිෂ්පාදන පිරියතක ස්ථාවර පිරිවැය මාසයකට රු. 260,000 කි. ජනවාරි මාසයේ සමාගමේ විකුණුම් ආදායම රු. 570,000 ක් සහ විචල්‍ය පිරිවැය මුළු එකතුව රු. 342,000 ක් ද විය.

සමච්ඡේදන ලක්ෂයෙහි (breakeven) විකුණුම් වටිනාකම කුමක්ද?

(අ) රු. 560,000

(ආ) රු. 433,333

**(ඇ) රු. 650,000**

(ඈ) රු. 260,000

34. එක් අංශයක නිෂ්පාදන තුනක් වන අතර එක් එක් ඒකකයක් වෙනුවෙන් වන තොරතුරු පහත දැක්වෙයි.

| | A නිෂ්පාදිතය | B නිෂ්පාදිතය | C නිෂ්පාදිතය |
|---|---|---|---|
| විකුණුම් මිළ (රු) | 180.00 | 220.00 | 210.00 |
| විචල්‍ය පිරිවැය (රු) | 60.00 | 80.00 | 70.00 |
| ශ්‍රම පැය | 3 | 5 | 2 |
| උපරිම ඉල්ලුම (ඒකක) | 100 | 150 | 120 |

වර්තමානයෙහි ශ්‍රමය පැය 1,200 කට සීමා වී පවතියි.

ලාභ ප්‍රශස්ත කිරීමට අංශය විසින් විකිණිය යුතු නිෂ්පාදිත මිශ්‍රණය කුමක්ද?

| | | | | | |
|---|---|---|---|---|---|
| **(අ)** | **A-100** | **:** | **B 132** | **:** | **C 120** |
| (ආ) | A-80 | : | B-150 | : | C-100 |
| (ඇ) | A-100 | : | B-150 | : | C-120 |
| (ඈ) | A-60 | : | B-130 | : | C-120 |

පහත දැක්වෙන තොරතුරු උපයෝගි කරගිනිමින් 35,36,37,38 සහ 39 වැනි ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

අෂර් සමාගම රු. 780,000 ක ආරම්භක ආයෝජනයක් සහිත ව්‍යාපෘතියක ආයෝජනය කිරීමට සැලසුම් කරයි. වසර 5 ක් සඳහා වාර්ෂික මුදල් ප්‍රවාහ පුරෝකථන පහත දැක්වෙන පරිදිය.

| වර්ෂය | මුදල් ප්‍රවාහය (රු) |
|---|---|
| 1 | 150,000 |
| 2 | 220,000 |
| 3 | 340,000 |
| 4 | 400,000 |
| 5 | 300,000 |

සමාගම ප්‍රාග්ධන පිරිවැය වශයෙන් 12% ක් භාවිතා කරයි. මෙම ආයෝජනයෙහි සරල රේඛීය ක්‍රමය මත 20% ක වාර්ෂිකව ක්ෂයවීමක් ඇති යන්ත්‍ර සූත්‍ර ඇතුලත් වේ.

35. ව්‍යාපෘතියෙහි ආපසු අයකර ගැනීමේ කාලය (Payback period) කුමක්ද?

**(අ) අවුරුදු 3 මාස 2 යි**
(ආ) අවුරුදු 2 මාස 3 යි
(ඇ) අවුරුදු 3 යි
(ඈ) අවුරුදු 4 යි

36. වට්ටම් කල ආපසු අයකර ගැනීමේ කාලය කුමක්ද?

(අ) අවුරුදු 3 මාස 4 යි

**(ආ) අවුරුදු 3 මාස 11 යි**

(ඇ) අවුරුදු 4 මාස 3 යි

(ඈ) අවුරුදු 4 මාස 11 යි

37. ගිණුම්කරන ප්‍රතිලාභ අනුපාතය (A R R) කුමක්ද?

(අ) 13%

(ආ) 63%

(ඇ) 31%

**(ඈ) 16%**

38. ව්‍යාපෘතියෙහි ශුද්ධ වර්තමාන වටිනාකම (N P V) කුමක්ද?

(අ) රු. 870,195

**(ආ) රු. 195,870**

(ඇ) රු. 630,000

(ඈ) රු. 975,870

39. ව්‍යාපෘතියෙහි අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (I R R) කුමක්ද?

(අ) 18.33%

(ආ) 15.25%

(ඇ) 24.23%

**(ඈ) 20.4%**

40. ආයෝජනයක ප්‍රාග්ධන පිරිවැය (C O C) සහ ශුද්ධ වර්තමාන අගය (N P V) සම්බන්ධයෙන් නිවැරදි වනුයේ පහත දැක්වෙන කුමන ප්‍රකාශයද?

(අ) COC සහ N P V අතර ධනාත්මක සම්බන්ධයක් ඇත.

(ආ) **COC සහ N P V අතර සෘනාත්මක සම්බන්ධයක් ඇත.**

(ඇ) COC සහ N P V අතර සම්බන්ධයක් නැත

(ඈ) සම්බන්ධතාවය ආයෝජනයෙහි ප්‍රමාණය මත රඳා පවතියි

41. සමාගමක ක්‍රියාකාරකම් ඊළඟ කාලපරිච්ඡේදයෙහි අඛණ්ඩව ස්වයංක්‍රීයව සිදු නොවනු ඇතැයි යන උපකල්පනය සහිතව........අයවැයක් ආරම්භ වෙයි.

(අ) විකුණුම්

**(ආ) ශුන්‍ය පදනම**

(ඇ) උපාය මාර්ගික

(ඈ) ප්‍රධාන

පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගනිමින් 42 වැනි සහ 43 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඩෙල්කෝ සමාගම 2009 වර්ෂයෙහි ඔවුන්ගේ විකුණුම් පුරෝකතනය පිළිබඳ පහත දැක්වෙන තොරතුරු සපයා ඇත.

| **මාසය** | **අයවැය ගත විකුණුම් (රු)** |
|---|---|
| ජනවාරි | 108,000 |
| පෙබරවාරි | 132,000 |
| මාර්තු | 144,000 |
| අප්‍රේල් | 120,000 |

සාමාන්‍යයෙන් විකුණුම් බඩුවල පිරිවැය විකුණුම් වටිනාකමෙන් 60% ක් වේ. 31/12/20 x 8 දිනට තොගය රු. 19,440 කි. අපේක්ෂිත අවසාන තොග මට්ටම් ඊළඟ මාසයෙහි විකුණුම් වල පිරිවැයෙන් 20% කි.

42. 28/02/20 x 9 දිනට අපේක්ෂිත තොගයෙහි වටිනාකම කොපමණද?
   (අ) රු. 15,840
   **(ආ) රු. 17,280**
   (ඇ) රු. 26,400
   (ඈ) රු. 28,800

43. ඒකකයක විකුණුම් මිල රු. 200ක් වන්නේ නම් මාර්තු මාසයේදී අවශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය කොපමණද?
   **(අ) ඒකක 696**
   (ආ) ඒකක 840
   (ඇ) ඒකක 720
   (ඈ) ඒකක 984

44. 20 x 8 අවසාන මාස 6 සඳහා සමාගමක විකුණුම් අයවැය පහත දැක්වෙන පරිදිය.

| මාසය | (රු) |
|---|---|
| ජූලි | 100,000 |
| අගෝස්තු | 80,000 |
| සැප්තැම්බර් | 110,000 |
| ඔක්තෝම්බර් | 80,000 |
| නොවැම්බර් | 100,000 |
| දෙසැම්බර් | 94,000 |

ඓතිහාසික මුදල් රැස්කිරීමේ රටාව පහත සඳහන් අයුරිනි.

විකුණුම් වලින් 65% ක් විකුණු මාසය තුළ එකතු කර ගනියි.

විකුණුම් වලින් 25% ක් විකුණු මාසයට පසු මාසයේ එකතු කර ගනියි.

විකුණුම් වලින් 8% ක් විකුණු මාසයට පසු දෙවැනි මාසයේ එකතු කර ගනියි.

විකුණුම් වලින් 2% ක් එකතු කර ගත නොහැකිය.

මාසයේ අපේක්ෂිත මුළු මුදල් එකතුව කොපමණද?

(අ) රු. 79,500

**(ආ) රු. 85,900**

(ඇ) රු. 92,400

(ඈ) රු. 99,500

45. නඩත්තු පිරිවැය සඳහා අයවැය ප්‍රමාණයට අඩුවෙන් වියදම් කිරීමෙන් .....විචලනයක් ඇති කරනු ලබයි. තත්‍ය ආදායම් අයවැයගත ආදායම් ඉක්මවූ විට එහි ප්‍රතිඵලය ලෙස ......විචලනයක් ඇති වෙයි.

හිස්තැන් පිරවීමට සුදුසු පිළිතුරු යුගලය වනුයේ

(අ) අවාසි දායක/අවාසි දායක

(ආ) අවාසි දායක/වාසි දායක

(ඇ) වාසි දායක/අවාසි දායක

**(ඈ) වාසි දායත/වාසි දායක**

පහත දැක්වෙන තොරතුරු උපයෝගි කරගනිමින් 46 වැනි සහ 47 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

Trest සමාගමෙහි ද්‍රව්‍ය (material) භාවිතය පිළිබඳ පහත දැක්වෙන තොරතුරු ඇත. රු. 880,000 ක මුළු පිරිවැය එකතුවට ද්‍රව්‍ය (material) කි.ග්‍රෑම් 88,000 ක් භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කරන අයවැය ගත නිෂ්පාදන ප්‍රමාණය 80,000 කි. සමාගම මසකට ඒකක 90,000 ක් නිෂ්පාදනය කළේය. සෘජු ද්‍රව්‍ය කි. ග්‍රෑම් 82,000 ක මුළු පිරිවැය එකතුව රු. 984,000 කි.

46. සෘජු ද්‍රව්‍ය මිළ විචලනය (Direct material price variance) කොපමණද?

(අ) රු. 180,000 වාසිදායක (favourable)

**(ඇ) රු. 164,000 අවාසිදායක ( unfavourable )**

(ඈ) රු. 164,000 වාසිදායක

(ඈ) රු. 180,000 අවාසිදායක

47. සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය (Direct material usage variance) කොපමණද?

(අ) රු. 204,000 වාසිදායක (favourable)

(ඇ) රු. 170,000 අවාසිදායක ( unfavourable )

**(ඈ) රු. 170,000 වාසිදායක**

(ඈ) රු. 204,000 අවාසිදායක

පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගනිමින් 48,49 වැනි සහ 50 වැනි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සමාගමක් පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් ක්‍රමය (FIFO) භාවිතා කරමින් ඔවුන්ගේ තොග ඇගයීම සිදු කරයි. 2 x 20 අප්‍රියෙල් මස 01 වැනි දින සමාගමේ තොගයෙහි ඒකක රු. 190 බැගින් අගය කළ ඒකක 700 ක් තිබිණ. 2 x 20 මාර්තු 31 න් අවසන් වූ වර්ෂයේ දී පහත දැක්වෙන ගනුදෙනු සිදුවිය.

2 x 20 ජූලි 01 දින එකක් රු. 220 බැගින් වූ ඒකක 500 ක් මිළයට ගත්තේය.

2 x 20 නොවැම්බර් 01 දින ඒකක 400 ක් රු. 160,000 කට විකුණුවේය.

2 x 21 පෙබරවාරි 01 දින එකක් රු. 230 බැගින් ඒකක 300 ක් මිළයට ගත්තේය.

2 x 21 මාර්තු 15 දින ඒකක 250 ක් රු. 125,000 කට විකුණුවේය.

48. 2 x 21 මාර්තු 31 දින සමාගමේ අවසාන තොගයෙහි වටිනාකම කොපමණද?

**(අ) රු. 188,500**

(ආ) රු. 195,000

(ඇ) රු. 166,000

(ඈ) රු. 160,000

49. 2 x 21 මාර්තු 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා විකුණුම් පිරිවැය කොපමණද?

(අ) රු. 132,500

(ආ) රු. 313,000

**(ඇ) රු. 123,500**

(ඈ) රු. 179,000

50. 2 x 21 මාර්තු 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා දළ ලාභය කොපමණද?

(අ) රු. 285,000

**(ආ) රු. 161,500**

(ඇ) රු. 106,000

(ඈ) රු. 96,500